මාධ්‍ය නිවේදන අංක 07

මැතිවරණ කොමිෂන් සභාව

**2022.03.16** වන දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව පහත සඳහන් තීරණවලට එළැඹුණු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

- 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත හා අදාළ ලේඛන පරිශීලනය කිරීමෙන් පසුව ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පක්ෂයේ ලේකම්වරයා ලෙස වී. ආනන්ද සංගරී මහතා මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගැනීම.

- 2022 වර්ෂයේ දේශපාලන පක්ෂයක් වශයෙන් ලියාපදිංචි වීම සඳහා නියමිත දිනයට පසුව ලැබුණු අයදුම්පත්‍ර තුනක් නියමිත දිනට ඉදිරිපත් කර නොතිබීම මත ප්‍රතික්ෂේප කිරීම.

- 2020.08.05 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාවේ වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් ප්‍රකාශයට පත් කිරීම හා එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

2022.03.16